# මගේ දඟ මල්ල




කතෘගේ නම

සිතුම්යා දහම්ලි මෙලිසා නුරාගොඩ



# මගේ දඟ මල්ල

කතෘගේ නම
සිතුම්යා දහම්ලි මෙලිසා නුරාගොඩ

# මගේ දඟ මල්ල

ප්‍රථම මුද්‍රණය 2025 ජනවාරි

කතෘ ප්‍රකාශනයකි

කතාව සහ චිත්‍ර
සිතුම්යා දහම්ලි මෙලිසා නුරාගොඩ

ISBN No. : 978-624-208-324-7

3 ශ්‍රේණිය B
මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර

# පිදුම

රසවත් කතා මවන්නට
පෙර හුරු ගැන්වූ දහමින්
මුල් පිටු රසවත් කළ
දැනුමෙන් මගේ ලොව ඒළිය කළ
පුංචි මල් කැකුළු මිලානව යා
නොදී පිපි සුවඳ හමන්නට
මඟ පෙන්වූ තෙරුවන් සරණයි මගේ
ගුරු මඬුල්ල.

# පෙරවදන

සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරඳන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන **"හෙරණගත්කරණි"** ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

මගේ දඟමල්ල මගේ ම පුංචි නංගියි. එයාට දඟමල්ල කියන්නේ එයා හරිම දඟ නිසයි. දවස තිස්සේම සෙල්ලම විතරයි. වෙන කිසිම දෙයක් කරන්නේ නෑ.



ඒත් මගේ නංගි පොත් වල වැඩත් ටිකක් කරනවා. දැඟ උනාට නංගි අම්මාට, තාත්තාට, මට ගොඩාක් ආදරෙයි.



“අක්කේ, අම්මා ගෙදර නෑ අපි සීනි ටිකක් කමුද ? අනේ මට බෑ අම්මා ආවොත් හොඳටම බැනුම් අහගන්න වෙයි.

හරි ඔයාට බැරිනම් ඉන්න මම ගිහින් සීනි කනවා කියලා නංගි කුස්සිය පැත්තට ගියා.




අම්මා දන්නවා අම්මා ගෙදර නැති වෙලාවට නංගි සීනි කනවා කියලා. නංගිට හොඳ පාඩමක් උගන්වන්න ඕන කියලා හිතලා අම්මා සීනි බෝතලෙයි, ලුණු බෝතලෙයි මාරු කරා.



නංගි හෙමින් හෙමින් කුස්සිය පැත්තට ගියා. පුටුව තියලා උඩට නැග්ගා. සීනි බෝතලය කියලා හිතලා ලුණු බෝතලය අතට ගත්තා.



හැන්ද පුරවලා ලුණු හැන්දක් නංගි කටට දාගත්තා. නංගිගේ කට ඇඹුල් වුන පාර කලබල වී දඩෝන් කියලා ලුණු බෝතලෙත් එක්ක නංගි බිමට වැටුනා.





ඒ වෙලාවෙම අම්මා ගෙදර ආවා මමත් දුවගෙන ගියා මොකද්ද සද්දේ බලන්න. අම්මයි මමයි කුස්සියට යද්දි නංගි බිම වැටිලා අඬමින් හිටියා අම්මා හොඳටම බය වුනා.



අම්මා නංගිට හොඳටම බැන්නා. " ඔයා මම ගෙදර නැති වේලාවට දඟවැඩ නොකර ඉන්න කියලා අවවාද කරා."



අම්මා නංගිට බැන්නට දුක හිතිලා නංගිව ළඟට ඇරගෙන ආදරෙයන් පුතේ ඔයා මම නැති වේලාවට ඔය වැඩේ කරන නිසයි බෝතල් මාරු කරේ. ආය කවදාවත් දඟ වැඩ කරන්නේ නෑ කියලා පොරොන්දු වෙන්න.



“ මම මීට පස්සේ අක්කා වගේ කීකරු ළමයෙක් වෙනවා. මම ආයෙත් දඟ වැඩ කරන්නේ නැහැ. ” නංගි අම්මාට පොරොන්දු වුණා.

මගේ දඟ මල්ල කීකරු ළමයෙක් වුණේ මෙහෙමයි.

නංගියේ මල්ලියේ ඔයාලත් අම්මට තාත්තාට කීකරු ළමයෙක් වෙන්න.



# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදි මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරි මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාකෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනාකරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්